# විසඳුම

ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට මෙතරම් කල් ගතවන්නේ ඇයි? විසඳුමක් සෙවීමට නම් ප්‍රශ්නය ගැන අවබෝධයක් තිබිය යුතු ය. විසඳුමක් සෙවීමේ දී ප්‍රශ්නය ගැන අවබෝධයක් තිබීම යනු විසඳුමෙන් ඉතා විශාල ප්‍රමාණයක් දැන ගැනීම ය. බොහෝ විට විසඳුමක් සෙවීමේ දී වැදගත් ම කාර්යය වනුයේ ප්‍රශ්නය කුමක් දැයි දැනගැනීම ය. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයේ ප්‍රශ්නය කුමක් දැයි නොදැන අද බොහෝ දෙනා අතරමං වී සිටිනු දැකිය හැකි ය.

මේ ප්‍රශ්නය ගැන සංවාද මෙහෙයවන රූපවාහිනී නාලිකාවලට ප්‍රශ්නය කුමක් දැයි දැනගැනීමට අවශ්‍ය නැත. ඔවුන්ට අවශ්‍යවන්නේ ප්‍රශ්නයට මුවා වී වැඩසටහන් කිහිපයක් නිෂ්පාදනයකිරීමත් එහි දී විරුද්ධ මත දරන්නන් පොර කුකුලන් මෙන් යොදාගැනීමත්, ඒ ඔස්සේ වෙළෙඳ දැන්වීම් ලබාගැනීමත් ය. දේශපාලන වැඩසටහන මෙහෙයවන්නා බොහෝ විට මැදින් නැතහොත් අගින් ප්‍රශ්නයට ප්‍රවිෂ්ට වෙයි. එවිට කතාකෙරෙන්නේ වෙනත් ප්‍රශ්නයක් ගැන ය. උදාහරණයක් වශයෙන් ලංකාවට අවශ්‍යවන්නේ සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ද ඒකීය ක්‍රමයක් ද යනුවෙන් ප්‍රශ්නය ඇසිය හැකි ය. එහෙත් ප්‍රශ්නය වනුයේ එවැනි ප්‍රශ්නයක් ඇසීමට හේතුව කුමක් ද යන්න ය.

මේ රූපවාහිනී වැඩසටහන්වලට මා අවසන් වශයෙන් සහභාගි වුයේ බොහෝ කලකට පෙර ය. ඒ අවසන් වැඩසටහනෙහි දී ප්‍රශ්නයට මැදින් ප්‍රවිෂ්ට නොවී ආරම්භයෙන් ම ප්‍රවිෂ්ට වීමේ වැදගත්කම සඳහන් කෙළෙමි. ඉන්පසු එවැනි වැඩසටහන්වලට මට ආරාධනය කෙරී නැත. ඇති ප්‍රශ්නය වෙනුවට වෙනත් ප්‍රශ්න ගැන කතාකිරීම හිඟන්නාගේ තුවාලය තබාගැනීම වැනි ක්‍රියාවකි. තුවාලය සුව වුවහොත් හිඟා කෑමට නො හැකි ය. වැරදි ප්‍රශ්න ගැන කතාකරන තරමට රූපවාහිනී වැඩසටහන් නිපදවිය හැකි ය. නියම ප්‍රශ්නය ගැන කතාකර ඒ විසඳාගතහොත් ඒ පිළිබඳ වැඩසටහන් ද එතෙකින් නතර වෙයි. එපමණක් නොව රාජ්‍ය නොවන සංවිධානවල ද විරැකියාවක් ඇතිවෙයි.

ප්‍රශ්නය විසඳාගැනීමට පත්කර ඇති ආයතනවල ද ප්‍රශ්නය නොවිසඳෙන්නේ ප්‍රශ්නය ග්‍රහණය කර ගැනීමේ දී එල්බ ගන්නා විවිධ මතිමතාන්තර හේතුවෙන් ය. ඒ අතර වෙනත් බලපෑම් ද වෙයි. බටහිර බලපෑම් ඉන් ප්‍රධාන වෙයි. දෙමළ පක්ෂවලට හා මුස්ලිම් පක්ෂවලට එකට එකතු වී ඒකකය පළාත ලෙස ගෙන සන්ධීය ක්‍රමයක් ඉල්ලන ලෙස බටහිර රටවලින් බල කෙරෙයි. ඇතැම් පක්ෂ එයට අකමැති වුවත් බලපෑම හේතුකොටගෙන ඒ ඉල්ලීම සමග එකඟවීමට ඒ පක්ෂවලට සිදු වී ඇත.

ප්‍රශ්නයේ ප්‍රධාන කොටස්කරුවන් බවට පත්කෙරී ඇත්තේ සිංහල, උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ, වතුකරයේ දෙමළ හා මුස්ලිම් ජනයා ය. එහෙත් බොහෝ දෙනා පිළිගන්නා, එහෙත් ප්‍රසිද්ධියේ නොකියන කරුණ නම් ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් ම උතුරු හා නැගෙනහිර පළාත්වල, විශේෂයෙන් ම උතුරේ දෙමළ ජනයාගේ ප්‍රශ්නයක් බව ය. වතුකරයේ දෙමළ ජනයාට ඇති ප්‍රශ්නය කුමක් දැයි ඇසු විට ඔවුන්ට කීමට ඇත්තේ පාසලක් පටන්ගැනීම, රෝහලක් තැනීම වැනි කාර්යයන් ය. ඒ ප්‍රශ්න බොහෝ ප්‍රදේශවල සිංහලයන්ට ද ඇත. ඒ දෙමළ ජනයාට දෙමළ වීම නිසා පමණක් ඇති ප්‍රශ්න නො වෙයි.

මුස්ලිම් ජනයාට අද ඇති ප්‍රධාන ම ප්‍රශ්නය යම් අයුරකින් නැගෙනහිර පළාත උතුරු පළාත සමග ඒකාබද්ධ කළහොත් නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයාගේ ඉරණම කුමක් ද යන්න ය. මුස්ලිම් ජනයාට සිංහලයන් සමග ඇති ප්‍රශ්නයක් නැත. නැගෙනහිර පළාත උතුරු පළාත සමග ඒකාබද්ධ නොකෙරෙන්නේ නම් මුස්ලිම් ජනයාට කිවයුතු තරම් ප්‍රශ්නයක් නැත. මුස්ලිම් ජනයා මෙන් ම වතුකරයේ දෙමළ ජනයා ද ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට කොටු වුයේ මෑතක දී ය. ඔවුන් පමණක් නොව නැගෙනහිර පළාතේ දෙමළ ජනයා ද ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයේ කොටස්කරුවන් වුයේ 1948න් පසුව ය.

අද පවා කරුණා පාර්ශ්වය හා ප්‍රභාකරන් අතර ගැටුමේ පදනමෙහි ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත් අතර ඇති වෙනස ය. උතුරට යටත්වීමට නැගෙනහිර දෙමළ ජනයා අකමැති වෙති. එසේ නම් අවසාන වශයෙන් ගත්කල

© Prof. Nalin De Silva

ප්‍රශ්නය උතුරු පළාතේ දෙමළ ජනයාගේ ප්‍රශ්නයක් බව පැහැදිලි ය. මේ ප්‍රශ්නයෙහි මුල ඇත්තේ ලන්දේසි හා බ්‍රිතානි ප්‍රතිපත්ති ය. ඒ සී අයි ඒ කුමන්ත්‍රණයක් හෝ බටහිර රටවල කුමන්ත්‍රණයක් හෝ නො වේ. බටහිර රටවල, විශේෂයෙන් ම බ්‍රිතානියෙහි ප්‍රතිපත්තිය ම එබඳු ය. ඔවුහු යම් රටක වඩාත් ම යටත්විජිත විරෝධී ජනවර්ගයට (ජාතියට) එරෙහිව අනෙක් ජනකොටසකට හෝ කොටස්වලට හෝ පක්ෂපාතීව කටයුතු කිරීමෙන් තම ආධිපත්‍යය රැකගනිති.

ලංකාවේ වත්මන් දෙමළ ජනයාගේ ඉතිහාසය සියවස් තුනහමාරකින් ඔබ්බට නො යයි. මෙරට තබා ඉන්දියාවේ ද,කිසිම දිනෙක දෙමළ රාජ්‍යයක් නො වී ය. මුහුදු කොල්ලකාර ආර්ය චක්‍රවර්තීන්ගේ රාජ්‍යයෙහි සිංහලයෝ ද මලයාලම් බස කතාකළ වේලක්කාරයෝ ද විසූ හ. ඒ රාජ්‍යය පෘතුගීසීන්ට යටත්වීමෙන් පසුව එහි වූ සංවිධිත සමාජය (පොලිටි) අඛණ්ඩව ඉදිරියට නො ගියේ ය. ලන්දේසීහු දුම්කොළ වැවීම සඳහා විශාල වශයෙන් දෙමළ ජනයා ගෙනැවිත් එහි වෙන ම සංවිධිත සමාජයක් ඇතිකළහ. ලන්දේසීන්ගෙන් බ්‍රිතානීන්ට ලැබුණු යාපන අර්ධද්වීපය, පෘතුගීසීන්ගෙන් ලන්දේසීන්ට ලැබුණු අර්ධද්වීපය නො වී ය. එහි වූයේ වෙනම ම සංවිධිත සමාජයකි. ඉන් පසු බ්‍රිතානීහු වත්මන් නැගෙනහිර පළාතේ ජන සංයුතිය වෙනස් කළහ. දහනවවැනි සියවසේ මැදභාගයේ පවා මණ්පෙයි නමින් අද හැඳින්වෙන ප්‍රදේශයෙහි බහුතරය සිංහල වූ බවට සාක්ෂි වෙයි. වත්මන් නැගෙනහිර පළාතට දෙමළ ජනයා ගෙන ආවෝ බ්‍රිතානීහු ය.

ලන්දේසීහු මෙරට වෙනම පරිපාලන ප්‍රදේශ හා අධිකරණ කලාප ඇතිකළහ. අද ඊලාම්වාදීන් වෙන ම රාජ්‍යයක් ඉල්ලන්නේ මේ අධිකරණ කලාප පදනම් කරගනිමිනි. මෙරට දෙමළ ජනයාට එතරම් ඈතට යන ඉතිහාසයක් නොමැති බව පෙන්වන හොඳම සාධකය භාෂාව ය. යාපනයේ කතාකරන දෙමළ භාෂාව හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ භාෂාව අතර අවුරුදු තුන්සිය පණහකට වඩා වෙනසක් නැති බව වාග් විද්‍යාත්මක ගවේෂණයකින් පෙන්වීමට හැකිවනු ඇත. බ්‍රිතානීහු ව්‍යවස්ථාදායකයෙහි, පරිපාලනයෙහි හා වෘත්තීන්හි දෙමළ ජනයාට, විශේෂයෙන් ම යාපනයේ වෙල්ලාලයන්ට සැලකිලි දක්වා වරප්‍රසාද ලබාදුන්හ. අද ප්‍රශ්නයෙහි ආරම්භය ඇත්තේ එතැන ය. බ්‍රිතානීන්ගෙන් ව්‍යවස්ථාදායකයෙහි ද සිංහලයන් හා සමාන නියෝජනත්වයක් ලැබූ යාපනයේ දෙමළ වෙල්ලාල ප්‍රභූහු එතැන් සිට දිගට ම ව්‍යවස්ථාදායකයෙහි සිංහලයන් හා සම අයිතිවාසිකම් ඉල්ලූහ. සර්වජන චන්දයත් සමග එලෙස සම නියෝජනත්වයක් ලැබිය නොහැකි බව තේරුම්ගත් දෙමළ නායකයෝ ක්‍රමයෙන් තම ආධිපත්‍යය පැතිරවිය හැකි වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීම දක්වා ගමන් කළහ. මෙහි දී වඩාත්ම කැපී පෙනෙන චරිතය වූයේ චෙල්වනායගම් මහතා ය. උතුරේ හා නැගෙනහිර වෙන ම රාජ්‍යයක් ඇතිකිරීම සඳහා නැගෙනහිර පළාතේ ජනයාගේ සහාය අවශ්‍ය බව තේරුම්ගත් ඔහු තම බෙදුම්වාදී අරගලයට පළමුව නැගෙනහිර පළාතේ දෙමළ ජනයා ද පසුව දෙමළ කතාකරන ජනයා යන පළල් භාවිතයෙන් එහි මුස්ලිම් ජනයා ද එකතුකර ගත්තේ ය. උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ජනයා අතර වූ වෙනස්කම් ද, දෙමළ ජනයා හා මුස්ලිම් ජනයා අතර වූ වෙනස්කම් ද ඊනියා ඊළමක් සඳහා සටනෙහි කෘත්‍රිම ව නැතිකරගැනීමට හැකි වේ යැයි ඔහු කල්පනා කෙළේ ය. එපමණක් නොව මේ සටනට චතුකරයේ දෙමළ ජනයා ද ඈඳාගැනීමට ඔහුට අවශ්‍ය විය.

අද වන විට ඒ බලාපොරොත්තු සියල්ල කඩ වී ඇති බව පැහැදිලි ය. ඒ විවිධ ජනකොටස් අද නැවතත් වෙන් වී ඇත. අද ඊළමක් සඳහා සටන්කිරීම ව්‍යාජයක් බව කොටි හැරෙන්නට අනෙක් සියල්ලෝ දනිති. එහෙත් බටහිරයන් තම ව්‍යාපාරය අත්හැර දමා නැත. ඔවුහු තවමත් අදාළ සියළු පක්ෂ එකතුකිරීමට කටයුතු කරති. එහෙත් අපට බටහිරයන්ගේ සැලසුම් පරාජයකිරීමට හැකිවිය යුතු ය. ඒ සඳහා ප්‍රශ්නයේ ආරම්භයට ගොස් විසඳුම් සෙවිය යුතු ය. එසේ නැතිව ප්‍රශ්නය අගින් ගෙන ඊළම වෙනුවට සන්ධීය රාජ්‍යයක් දෙන්නේ ද එසේත් නැත්නම් සහසන්ධීය රාජ්‍යයක් දෙන්නේ ද, එහි දී ඒකකය විය යුත්තේ පළාත ද නැත්නම් දිස්ත්‍රික්කය ද, ඒ ඒකකවලට බද්ධ වීමේ හැකියාව තිබිය යුතු ද ආදිය ගැන කතාකිරීම කාලය කා දැමීමක් පමණකි. විවිධ අර්ථකථන බොරු ප්‍රචාර ආදී දහසක් කරුණු හේතුකොටගෙන ප්‍රශ්නය විකාශය වී ඇති බව පැහැදිලි ය. එහෙත් ප්‍රශ්නයට විසඳුමක් ඇත්තේ මුල මිස අග නො වෙයි. දෙමළ ප්‍රභූන්ගේ අවශ්‍යතාව වූයේ ව්‍යවස්ථාදායකයෙහි සිංහලයන් හා සම ව කටයුතු කිරීම ය. ඒ එලෙසින් ගත්කල ඉටුකළ නො හැකි ය. එහෙත් බටහිරයන් ඇතිකළ නමුදු ප්‍රශ්නයට විසඳුම ආනයනය නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva